# සෙබළ සිතුවිලි දෙසතිය

2024
අප්‍රේල්
01 - 15

වෙළුම
XXI

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967

# සොබා දහම

මිනිස්සුන්ට බැරි උනාට
ලස්සනට ආදරය කරන්න
සොබාදහමට පුලුවන් හරි
ලස්සනට ආදරය කරන්න......

හඳත් එක්කම ඉන්න
ඒ පුංචි තරුව.....
මලක් පිපෙනකන් බලන් ඉන්න
ඒ පුංචි බඹරා........
රැල්ල එනකන් බලන් ඉන්න
ඒ වෙරල.......
කාන්තාරෙත් එක්කම ඉන්න
ඒ පතොක් ගහ.....

සොබාදහමට ආදරය කරන්න
පටන්ගත්තම
මිනුස්සුවෙච්ච අපි පරාදයි
එහෙම සොබාදහමකට ලෙන්ගතුව ආදරේ
කරොත් අපේ ආදරෙත් ලස්සන වේවි.....

සෙ/481335 ලාකෝ ලලිත් කුමාර බීඑස්කේ
16 ගරෙ



# ආදර වියෝව

ටජ්මහල හැදුවාට
සාජහන් මුම්ටාස් "වෙන්වුනා".....
කොයිතරම් පෙම් කලත්
රෝමියෝ ජුලියට් "වෙන්වුනා"....
දරුවෝ දෙන්නෙක් ඉද්දිම
විජය කුවේණි "වෙන්වුනා"....
ගමක් ගිණිබත්කරන්
කෝවලන් කන්නගී "වෙන්වුනා".....

පෙර කරපු පිං බලෙන්
හැමදාකටම "ලංවුනා"...
ඉසුරුමුණි පෙම් යුවල
වෙන් වෙන්න කලින්
වෙලාවට "ගල්වුනා".....

සෙ/11ප01740 ලා/කෝප්‍රල් බුද්ධික යුඩබ්ලිව්පි
11 (සෙව්) ශ්‍රීලංසිරෙ



# මල් කැකුළකි පුතුනි ලොවේ.....

නිල් දෙනුවන් දෑස් මතින්
හිනැහෙන ඔබෙ සෙනෙහෙ සිතින්
බොළඳ වදන් තෙපල මුවින්
සතුටු සිනහ මැවෙයි සිතින්

යන විට මම නිවස බලා
ඔහු සිටියා දෙනෙත අයා
එනු දැක මම මගේ පුතා
සිප ගත්තෙමි මාව බදා

එන විට යලි වැඩට එදා
ඔහු හැඩුවා මාව බදා
දුක් මුවගින් හිස අතගා
පුතු රැක දෙනු දෙවි සැමදා

සෙ/427228 කෝප්‍රල් රාජපක්ෂ ආර්සිසි
4 ගැජේබ



# අම්මා

කම්හලේ නිල් එළිය වැටිලා........
නුබේ ඇස් බොර වුණා අම්මේ...........
වෙලේ ඉපනැලි පවා මුමුණයි.........
නුබේ බුදු පා සුවද අම්මේ.......
ඇද්ද දරදිය දුන්න කරගැට........
ඇදුම් කන්නැති රැයේ රහසේ..........
අපි නිදන්නැති නොදැක කදුලැලි.........
සමා අවසර මගේ බුදුනේ..........

සෙ/1කිචි03972 ලා/කෝ ගොරකපිටිය එල්සි
1 ශ්‍රීලංජාආබමු



# සෙබළ සිත

සෙබලකුගේ ජීවිතය අහිමි වුවද
ගෞරවය කීර්තිය
සදාකල් හිමිය..........

ඔවුන් මාගේ මව්බිම තුල
අජරාමරයි සැමදිනම..........

එවන් රටක වෙසෙන
කරුණාව කෘතගුණ මිනිසත් බව
සිත්තුල නොමැති මිනිසුන් හට
රටත් ජාතියත්..........
සදාකල් අහිමිය..........

සෙ/47922 කෝප්‍රල් කුලරත්න පීආර්පී
16 ගරෙ

# ජීවිතය

යාළුකම කියන්නේ
අමතක නොවන දෙයකට
නෑකම කියන්නේ
රුධිර බැඳීමකට
හිතවත්කම කියන්නේ
හිත රිදුනු දෙයකට
ලෙන්ගතුකම කියන්නේ
හිත ඉල්ලන දේකට
ආදරය කියන්නේ
සංසාර පුරුද්දකට
ප්‍රේමය කියන්නේ
ආත්මීය බැඳීමකට
ජීවිතය කියන්නේ
හැමදේකම එකතුවකට

සෙ/4315148 ලා/ කෝප්‍රල් දේශප්‍රිය ටීඑම් අයි






ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967